Ministry of Labour

NIOSH
National Institute of Occupational Safety and Health • Sri Lanka

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
– 2019 –



ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

தேசிய தொழில்சார் பாதுகாப்பு மற்றும் சுகாதார நிறுவகம்

National Institute of Occupational Safety & Health



වාර්ෂික වාර්තාව
2019

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

වාර්ෂික වාර්තාව - 2019

සම්පාදනය:

චම්පිකා අමරසිංහ, මොහාන් පෙරේරා, සඳූලි සුමනදේව

පිටකවරය - තුසිත පෙරේරා

ප්‍රකාශනය:

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ
ප්‍රකාශන කමිටුව

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය
නො.97, ජාවත්ත පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව
ටෙලි: +94 112 2 585 425

සියලු හිමිකම් ඇවිරිණ

2021

ISBN 978-624-6017-00-2



ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය

2009 අංක 38 දරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙස ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටුවන ලදී. ස්වයං මූල්‍ය ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන අප ආයතනයේ මුඛ්‍ය පරමාර්ථය වනුයේ ජාත්‍යන්තර මට්ටමෙහි වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සේවාවන් ලබාදීමයි.

ආරම්භයේ පටන්ම සම්මන්ත්‍රණ පැවැත්වීම හා වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් පුහුණු කිරීම හා සාමාන්‍ය ජනතාව වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීම ආදී කටයුතුවල නිරතවී සිටින්නෙමු. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ වෘත්තීකයන්ට නව දැනුම ලබාදීමට හා ඔවුන්ගේ දැනුම ඔවුන් අතර හුවමාරු කර ගැනීමට අවශ්‍ය පසුබිම අප විසින් නිර්මාණය කරදෙන්නෙමු. වැඩ පරිසරයක් පවත්වාගෙන යාම පිළිබඳ ජනතාව දැනුවත් කිරීම, ආරක්ෂාකාරී වැඩ පරිසරයක් නිර්මාණය කිරීම හා නිවැරදි ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය දැනුම නිරන්තරයෙන් ලබාදීමට අප කටයුතු කරන්නෙමු.

අප සෑම විටම අපගේ පාරිභෝගිකයන්ට ගරු කරමින් අපක්ෂපාතීව තාක්ෂණික සේවාවන් ලබාදීමට කටයුතු කරන්නෙමු. වෘත්තීය අනතුරු වළක්වා ගැනීමට අවශ්‍ය දැනුම ඔවුන් වෙත ලබාදීමට මෙන්ම අවශ්‍ය අවස්ථාවලදී ඔවුන්ට අවශ්‍ය පුහුණුව ලබාදීමට ද අප නිරන්තයෙන් කැපවී සිටින්නෙමු. අප ලබා දෙන පුහුණුව තුළින් සේවා ස්ථානයේ ඇති අනතුරු හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය විසදුම් ලබා ගැනීමටත් ඔවුන්ට හැකියාව ඇත.

වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කටයුතු කරන එකම රාජ්‍ය ආයතනය අප ආයතනය වන බැවින් ශ්‍රී ලාංකික ජනතාවට අවශ්‍ය සේවාව සැපයීම උදෙසා අප නිරන්තරයෙන් කටයුතු කරන්නෙමු.

වෛද්‍ය එන් සි අමරසිංහ

අධ්‍යක්ෂ ජනරාල්

පටුන

ජාතික ව්‍යෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය	iii
පටුන	iv - v
පළමු පරිච්ඡේදය (ජාතික ව්‍යෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය)	1 - 4
1.1 හැඳින්වීම	2
1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු	3 - 4
1.3 සුවිශේෂී ප්‍රමුඛතා	4
1.4 ආයතනයෙහි කාර්ය මණ්ඩලයේ සංයුතිය	4
දෙවන පරිච්ඡේදය (ආයතනයේ ප්‍රධාන කාර්යයන්)	5 - 11
2.1 සේවා සැපයීම	6
2.1.1 දෛනික කටයුතු	6 - 10
අ. පාරිසරික මිනුම්	6
ආ. අවදානම් ඇගයීම	6
ඇ. වෛද්‍ය පරීක්ෂණ	6
2.1.2 විශේෂ වැඩසටහන්	7
අ. විශේෂ පුහුණුවීම්	7 - 8
• පළමු මට්ටම	8
• දෙවන මට්ටම	8
• තෙවන මට්ටම	8 - 9
ආ. ව්‍යාපෘති	9
ඇ. ජාතික ව්‍යෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මාන උළෙල	9
ඈ. ජාතික ව්‍යෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය	9
ඉ. ව්‍යෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්ට අදාළ පරීක්ෂණයන්හී නියැලීම	10
ඊ. ජාතික ව්‍යෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය නිලධාරී ජාතික සංගමය	10
උ. සුභසාධන කටයුතුවල නිරතවීම	10

2.1.3 ජාත්‍යන්තර සහයෝගීතාව	10
2.2 සේවා පහසුකම් දියුණු කිරීම	10
2.2.1 ආයතනයේ ප්‍රමිතිය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය තත්ත්ව සහතික ලබා ගැනීම	10
2.2.2 ආයතනයේ වැඩ පරිශ්‍රය දියුණු කිරීම	11
තෙවන පරිච්ඡේදය (ආයතනයේ ප්‍රගතිය)	13 - 26
සිව්වන පරිච්ඡේදය (ආයතනයේ සුවිශේෂ ජයග්‍රහණ)	27 - 28
පස්වන පර්ච්ඡේදය (ආයතනයේ මූල්‍ය විශ්ලේෂණය)	29 - 30

වගු නාමාවලිය

වගුව 1.1	ආයතනයේ කාර්ය මණ්ඩලයේ සංයුතිය	4
වගුව 3.1	පාරිසරික මිනුම් සමීක්ෂණ	14
වගුව 3.2	විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය	15
වගුව 5.1	ආයතනයේ මූල්‍ය විශ්ලේෂණය	30

ප්‍රස්තාර ලැයිස්තුව

ප්‍රස්තාරය 3.1	2016-2019 දක්වා කරන ලද පරීක්ෂණ	14
ප්‍රස්තාරය 3.2	2012-2019 දක්වා කරන ලද ඩිප්ලෝමා පාඨමාලාවල ප්‍රගතිය	16
ප්‍රස්තාරය 3.3	2012-2019 දක්වා කරන ලද සහතිකපත්‍ර පාඨමාලාවල ප්‍රගතිය	16

රූපසටහන

රූපසටහන 2.1	පාඨමාලා සැලැස්ම	7

ඡායාරූප ලැයිස්තුව

ඡායාරූපය 3.1	වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ සම්මාන උළෙල	19
ඡායාරූපය 3.2	වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ සම්මන්ත්‍රණ උළෙල	21
ඡායාරූපය 3.3	ඩිප්ලෝමා හා සහතිකපත්‍ර ප්‍රධානය කිරීමේ උළෙල	22
ඡායාරූපය 3.4	ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සතියේ පවත්වන ලද වැඩසටහන	24
ඡායාරූපය 3.5	නවීකරණය කරන ලද කාර්යාල පරිශ්‍රය හා දේශන ශාලාව	26

පළමු පරිච්ඡේදය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ යහපත් වෘත්තීය ආරක්ෂණ ක්‍රියාමාර්ග හා යහපත් සෞඛ්‍ය පුරුදු අනුගමනය කරමින් සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් බිහි කරලීමේ අරමුණින් 2009 අංක 38 දරණ ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය පිළිබඳ ආයතන පනත මඟින් කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය ස්ථාපිත කරන ලදී.

රටක් සංවර්ධනය කරා යන ගමනේදී එහි ප්‍රධාන දායකත්වය සලසන්නේ එරට වෙසෙන ශ්‍රම බලකාය බව අමුතුවෙන් කිවයුතු කරුණක් නොවේ. ඔවුන් තුළින් තිරසාර සංවර්ධනයක් අත්පත් කර ගැනීමට අවැසි වන්නේ නම් ඔවුන්ගේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සම්පන්නබව ඉහළ මට්ටමක පැවතීම අත්‍යවශ්‍ය කරුණක් වන්නේය. ශ්‍රී ලංකාව තුළ භාරදුර කර්තව්‍ය ඉටුකරනු වස් ඇපකැප වී කටයුතු කරන එකම රාජ්‍ය ආයතනය ලෙසින් අප ආයතනය ජාතික මෙහෙවරේ නිරත වන්නෙමු. එහිදී, අප නිරන්තරයෙන් සිදු කරන දෛනික කටයුතු, විශේෂ පුහුණුවීම් වැඩසටහන්, ආදිය මඟින් ශ්‍රී ලාංකීය ශ්‍රම බලකායේ සුරක්ෂිතතාව හා සෞඛ්‍ය සම්පන්නභාවය ඉහළ නැංවීමට අප කටයුතු කරනු ලැබේ.

දෛනිකව සිදු කරනු ලබන පාරිසරික මිණුම් සමීක්ෂණ, අවදානම් ඇගයීම හා වෛද්‍ය පරීක්ෂණ මඟින් මෙන්ම විශේෂ වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කරනු ලබන පුහුණුවීම්, ව්‍යාපෘති මඟින් හා වෙනත් රටවල් සමග අන්තර්ජාතික සහයෝගිතාවය මත සිදු කරනු ලබන ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලංකාව තුළ වැඩදායී ශ්‍රම බලකායක් බිහිකරවාලීමට අප වගබලා ගන්නෙමු.

සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස පවතින අප රටෙහි දළ දේශීය නිෂ්පාදනය ඉහළ නංවාලීමට සෘජුවම බලපෑම් එල්ල කරනු ලබන වැඩ කරන ජනතාවගේ සේවයේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සම්පන්න බව ආරක්ෂා කරදෙමින් සංවර්ධනය කරා වේගයෙන් පියනැඟීමට අවශ්‍ය වන ශ්‍රම බලකායක් අප රටට දායාද කිරීම අපගේ වගකීමයි. එසේ යන ගමනේදී අප ආයතනයේ සහාය නොමඳව ලබාදීමට අප නිරන්තයෙන් කැප වී සිටින්නෙමු.

1.2 දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

"සැමට වෘත්තීය සුරක්ෂිතතාව සෞඛ්‍ය හා සුභසාධනය ලබාදීම"

මෙහෙවර

"සේවා ස්ථානවල සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සහතික කරලීම සහ ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා සියලු ආකාරයේ රැකියා උපද්‍රවයන් වළක්වාලීම පිණිස අධ්‍යාපනය පුහුණුව හා පර්යේෂණය තුළින් ත්‍රෛපාර්ශවීය කොටස්කරුවන් සවිබල ගැන්වීම"

ආයතනයේ අරමුණු

(අ) සේවායෝජකයන්ගේ සහ සේවාදායකයන්ගේ ආරක්ෂාව සහ රැකියාවේ ආරක්ෂාව සහ රැකියාවේ ස්වභාවය සැලකිල්ලට ගනිමින් ඒ සේවායෝජකයන් සහ සේවාදායකයන් යන දෙපාර්ශවයේම සේවා පරිසරය සම්බන්ධයෙන් වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ දී රජයට උපදෙස් දීම

(ආ) සේවා ස්ථානවල දී රැකියාවට අදාළව සිදුවන හදිසි අනතුරු සහ තුවාල වැළැක්වීම සඳහා ගතයුතු පියවර සම්බන්ධයෙන් රජයට උපදෙස් දීම

(ඇ) වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විමර්ශන අධ්‍යාපන වැඩසටහන් සමීක්ෂණ සහ පර්යේෂණ පැවැත්වීම කරගෙනයාම සහ ඒවාට සහාය දීම

(ඈ) උපකරණ, අන්තරායදායක ද්‍රව්‍ය, භෞතික, රසායනික හෝ ජීව විද්‍යාත්මක කාරක හෝ නිෂ්පාදන හෝ වෙනත් යම් අන්තරායකාරී ද්‍රව්‍ය නිවැරදිව භාවිතා කිරීම පිළිබඳ යම් ආයතනයකට හෝ තැනැත්තකුට උපදේශන සේවා සැපයීම

(ඉ) වෙනත් යම් ආයතනයක් හෝ ශ්‍රී ලංකාවේ හෝ පිටරටක විශ්වවිද්‍යාලයක් සමඟ සහයෝගීතාවයෙන් හෝ ආයතනය විසින් වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ සහ ආශ්‍රිත විෂයයන් පිළිබඳ දැනුම සහ පුහුණුව අවශ්‍ය කරන සේවා නියුක්තිකයන්ට, පදිංචිකරුවන්ට, සේවකයන්ට හෝ වෙනත් යම් තැනැත්තකුට අධ්‍යාපන සහ අවශ්‍ය පුහුණුව ලබාදීම සහ ඒ අධ්‍යාපනය හෝ පුහුණුව නිම කිරීමෙන් පසු සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම

(ඊ) උපකරණ, අන්තරායදායක ද්‍රව්‍ය, භෞතික, රසායනික, ජීවවිද්‍යාත්මක ද්‍රව්‍ය හෝ නිෂ්පාදන නිවැරදිව භාවිත කිරීම පිළිබඳ සහ මනෝ සමාජ අන්තරායන් සහ හදුනාගත් අන්තරායන් වැළැක්වීම පිළිබඳ අවශ්‍ය කරන සේවාවන් සැපයීම

(උ) (i) වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍යයට අදාළ වන කාරණාවලදී ප්‍රමිති, සංකේත, පරිචය සහ නියමු උපදේශන සම්බන්ධයෙන් නීතිමය අවශ්‍යතා පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස්දීම

(ii) වැඩ කටයුතු නිවැරදිව ක්‍රියාත්මක වන්නේ ද යන්න අධීක්ෂණය හා නිසියාකාරව සිදු වන්නේ ද යන්න ඇගයීමට ලක්කිරීම

(ඌ) වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යට අදාළ තොරුතුරු එක්රැස්කිරීම, සකස්කිරීම, බෙදාහැරීම සහ ප්‍රකාශයට පත්කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම

(සෘ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය සම්බන්ධව සම්මන්ත්‍රණ, වැඩමුළු හා වෙනත් වැඩසටහන් සම්පාදනය කිරීම සහ අනුග්‍රහය දැක්වීම

(සෘෘ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම

(ඍ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ පුහුණු ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා පුස්තකාල සහ විද්‍යාගාර පිහිටුවා පවත්වාගෙන යාම

(ඎ) පර්යේෂණ සහ විශේෂ රසායනාගාර සංවර්ධනය කිරීම

(එ) වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ජාතික හා ජාත්‍යන්තර ආයතන විශ්ව විද්‍යාල හා අනෙකුත් සංවිධාන සමඟ සබඳතා පවත්වාගෙන යාම

(ඒ) වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය යන ක්ෂේත්‍රවල ජාතික ප්‍රමිතීන් ස්ථාපනය කිරීම

1.3 සුවිශේෂී ප්‍රමුඛතා

1. වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පනත අනුව කටයුතු කරමින් කාලීන අවශ්‍යතාවයන්ට අනුව සේවා සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ගොඩනංවාලීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

2. වැඩකරන ජනතාවට ආරක්ෂිත පරිසරයක් තුළ සෞඛ්‍ය සම්පන්නව සේවයේ නිරත වීමට අවශ්‍ය වැඩ පරිසරයන් සේවා ස්ථානය තුළ නිර්මාණය කරදීමට කටයුතු කිරීම

3. වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන්ගේ දැනුම වර්ධනය කරමින්, නව තාක්ෂණික උපකරණ පිළිබඳව අවබෝධය ලබා දෙමින් ප්‍රමිතියෙන් ඉහළ සෞඛ්‍ය හා ආරක්ෂණ ක්‍රම සේවා ස්ථානවල පවත්වාගෙන යාමට අවශ්‍ය පසුබිමක් සකස් කිරීම

4. කාලීනව සේවා ස්ථානවල පැන නඟින සෞඛ්‍ය හා ආරක්ෂණ ගැටළුවලට පිළියම් සෙවීමට නිරන්තරයෙන් කටයුතු කිරීම

1.4 ආයතනයේ කාර්ය මණ්ඩලයේ සංයුතිය

ජ්‍යෙෂ්ඨ මට්ටම		තෘතීය මට්ටම		ද්විතීය මට්ටම		ප්‍රාථමික මට්ටම		එකතුව		
අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	සාරල්‍යාඩු
07	02	03	03	10	06	05	05	25	16	36%

වගුව 1.1 - ආයතනයේ කාර්ය මණ්ඩලයේ සංයුතිය

දෙවන පරිච්ඡේදය

ආයතනයේ ප්‍රධාන කාර්යයන්

ආයතනයේ ප්‍රධාන කාර්යයන්

ආයතනයේ ප්‍රධාන කාර්යයන් පිළිබඳව විමසා බැලූ කල එය ප්‍රධාන කොටස් 2කින් සමන්විතය. එනම්, සේවා සැපයීම හා සේවා පහසුකම් දියුණු කිරීමයි.

2.1 සේවා සැපයීම

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ ප්‍රධානතම කාර්යයන් වන්නේ සේවාලාභීන්ට අවශ්‍යවන සේවාවන් ලබා දීමයි. එහිදී අප විසින් දෛනික කටයුතු මඟින්, විශේෂ වැඩසටහන් මඟින් හා ජාත්‍යන්තර සහයෝගිතාව මත පදනම් වෙමින් සේවා සැපයීම සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. ඒවා වෙන් වෙන්ව අනු මාතෘකා වශයෙන් පහතින් විමසීමට ලක්කරනු ඇත.

2.1.1 දෛනික කටයුතු

- පාරිසරික මිනුම් සමීක්ෂණ
- අවදානම් ඇගයීම
- වෛද්‍ය පරීක්ෂණ

අ. පාරිසරික මිනුම් සමීක්ෂණ

සේවා ස්ථානවල වැඩ පරිසරය රැකියාවේ නිරතවීමට අවශ්‍ය මට්ටමක පවතින්නේද යන්න පාරිසරික මිනුම් සමීක්ෂණ මඟින් විමසුමට ලක්කරනු ලැබේ. වාතයේ තත්ත්වය සමීක්ෂණය කිරීම, දුම් පරීක්ෂා කිරීම, කර්මාන්තය තුළ දූවිලි මට්ටම සමීක්ෂණය කිරීම, ශබ්ද මට්ටම මැනීම සහ උෂ්ණත්ව මට්ටම සමීක්ෂණය කිරීම මෙහිදී සිදුකරනු ලැබේ. වැඩ පරිසරය යෝග්‍ය මට්ටමක පවතින්නේද යන්න උපකරණ යොදා ගනිමින් පරීක්ෂාවට ලක් කිරීම මෙහිදී සිදුවේ. සෞඛ්‍යාරක්ෂිතව සේවයේ නිරතවීමට අවශ්‍ය පරිසරය ගොඩනැංවීමට ඔවුන්ට අවශ්‍ය උපදෙස් ලබාදීම සිදුකරන අතර ඒ පිළිබඳව නිරන්තර දැනුවත් කිරීම් අප විසින් අදාළ ආයතනය වෙත ගොස් මෙන්ම අප ආයතනය තුළදී ද සිදු කරනු ලැබේ.

ආ. අවදානම් ඇගයීම

සේවයේ නිරත සේවකයන්ට මුහුණදීමට සිදුවන අවදානම් සහගත තත්ත්වයන් පිළිබඳව විමසීමට ලක් කිරීමට අවදානම් ඇගයීම සිදු කරනු ලැබෙයි. එහිදී ද සුරක්ෂිතතා නිළධාරීන් අදාළ ආයතනය වෙත ගොස් එහි පවතින අවදානම් සහගත තත්ත්වයන් පරීක්ෂාවට ලක්කරනු ලැබෙයි. ආයතනය පරීක්ෂාවට ලක්කර එහි පවතින අවදානම් සහගත තත්ත්වයන් පිළිබඳව ඔවුන් දැනුවත් කරන අතර ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ඔවුන්ට උපදෙස් ලබාදීම සිදුකරනු ලබයි.

ඇ. වෛද්‍ය පරීක්ෂණ

සේවකයන්ගේ සෞඛ්‍ය මට්ටම සේවය කිරීමට තරම් යෝග්‍ය මට්ටමක පවතින්නේද යන්න නිශ්චය කිරීම උදෙසා වෛද්‍ය පරීක්ෂණ සිදු කරනු ලැබේ. එහිදී පුද්ගලයන්ගේ ශ්‍රවණ තත්ත්වය මැනීමේ පරීක්ෂණ රුධිර විශ්ලේෂණය, පෙනහළුවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම, දෘෂ්ටිය පරීක්ෂණ හා වැඩ කිරීමේ යෝග්‍යතාව තක්සේරු කිරීමේ පරීක්ෂණ අප විසින් සිදු කරන ලබයි. මේ සඳහා වෛද්‍යවරයන් හා අපගේ තාක්ෂණික නිලධාරීන් සහභාගී වන අතර ශ්‍රමිකයන් සේවයේ නිරත වීමට යෝග්‍යවන්නේද යන්න හා ඔවුන් තුළ පවතින

රෝගාබාධ මොනවාද යන්න අදාළ ආයතනය දැනුවත් කරනු ලැබේ. එමෙන්ම ඔවුන් තුළ පවතින රෝගාබාධ සඳහා අනුගමනය කළ යුතු පිළිවෙත් මොනවාද යන්න පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමද මෙහිදී සිදු කරනු ලැබේ. අප විසින් අදාළ ආයතනය වෙත ගොස් මෙන්ම අප ආයතනය තුළදී ද මෙම පරීක්ෂාවන් සිදු කරනු ලැබේ.

2.1.2 විශේෂ වැඩසටහන්

දෛනික සේවාවන් සැපයීමට අමතරව විශේෂ වැඩසටහන් පවත්වාගෙන යාම අප ආයතනයේ සපයන ප්‍රධාන සේවාවකි. එහිදී පුහුණු වැඩසටහන්, ව්‍යාපෘති, සම්මාන උළෙල පැවැත්වීම, සම්මන්ත්‍රණ පැවැත්වීම හා ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණයන් නියැලීම අප විසින් සිදු කරනු ලැබේ. නිරන්තරයෙන්ම සිදුකරනු ලබන සේවාවන්ට අමතරව රටට සේවාවන් සැපයීමේ මුඛ්‍ය පරමාර්ථය පෙරදැරි කරගනිමින් කර්මාන්තයන්හි පවතින අවශ්‍යතාවන් හඳුනාගෙන මෙම විශේෂ වැඩසටහන් සිදුකරන අතර සමහර අවස්ථාවන්හිදී ආයතනවල ඉල්ලීම මතද මෙම විශේෂ වැඩසටහන් අප විසින් ක්‍රියාවට නංවනු ලැබේ.

අ. විශේෂ පුහුණුවීම්

අප විසින් සිදුකරනු ලබන විශේෂ පුහුණුවීම් වැඩසටහන් ප්‍රධාන මට්ටම් තුනක් යටතේ සිදු කරනු ලැබේ. එහිදී,

- පළමු මට්ටම
- දෙවන මට්ටම
- තෙවන මට්ටම

වශයෙන් ප්‍රධාන මට්ටම් ලෙස අප ආයතනයේ පුහුණු පාඨමාලා හා වැඩමුළු බෙදා වෙන්කර ඇත. එහිදී වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳව අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරන පුද්ගලයන් ලබා ඇති අධ්‍යාපන මට්ටම් අනුව සහ සේවා පළපුරුද්ද මත මෙම පාඨමාලාවන් හා පුහුණුවීම් සඳහා සහභාගිවීමට අවස්ථාව හිමි කර දෙනු ලැබේ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා උසස් ඩිප්ලෝමා පාඨමාලාව, ජාතික වෘත්තීය සුරක්ෂිතතා ඩිප්ලෝමා පාඨමාලාව (NVQ 05), ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහතික පත්‍ර පාඨමාලාව හා කෙටිකාලීන පුහුණුවීම් වැඩසටහන් අප විසින් පවත්වනු ලැබේ. එහි පාඨමාලා සැලැස්ම පහත ආකාරයට දැක්විය හැකිය.



රූපසටහන 2.1 පාඨමාලා සැලැස්ම

■ පළමු මට්ටම

අප විසින් සිදුකරනු ලබන කෙටි කාලීන පුහුණු වැඩමුළු පළමු මට්ටමට ඇතුළත් වන විශේෂ පුහුණු වීම් ලෙස දැක්විය හැකිය.

- ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන වැඩමුළු
- අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණුවීම් වැඩමුළු
- වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු
- හෙදියන් සඳහා වන වැඩමුළු
- සෞඛ්‍ය සේවකයින් සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- කාර්යාල සේවකයින් සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- රසායනාගාර සේවකයින් සඳහා රසායනාගාර ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- ආහාර කළමනාකරණය සඳහා වෘත්තීය ආරක්ෂාව පිළිබඳ වැඩමුළු
- කාර්මික සේවකයින් සඳහා ආරක්ෂිත රසායනික කටයුතු පිළිබඳ වැඩමුළු
- සේවකයින් සඳහා යහපත් මානසික සෞඛ්‍යයන් පවත්වාගෙන යාම පිළිබඳ වැඩමුළු

මෙම පුහුණුවීම් දිනක්, දෙකක් හෝ තුනක් සාමාන්‍ය වශයෙන් පවත්වනු ලැබේ. සමහර අවස්ථාවලදී කර්මාන්තයන්හි ඉල්ලීම පරිදි මෙම පුහුණු වැඩසටහන් ක්‍රියාවට නංවනු ලැබේ. මෙම පුහුණුවීමේ වැඩසටහන් පළමු මට්ටමේ පුහුණුවීම් වන අතර අදාළ පුහුණුවීම් අවසානයේ දී ඔවුන් ලැබූ පුහුණුව පිළිබඳව සහතික පත්‍රයක් ද ඔවුන් වෙත ලබාදීමට අප කටයුතු කරනු ලැබේ.

■ දෙවන මට්ටම

දෙවන මට්ටමට අයත් පුහුණුවීම් වැඩසටහන් ලෙස ප්‍රධාන වශයෙන් අප පවත්වනු ලබන්නේ ජාතික වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ වූ සහතිකපත්‍ර පාඨමාලාවයි. වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳව ආධුනිකයන් සඳහා මෙම පාඨමාලාව යෝග්‍ය වන්නේය. අධ්‍යාපන මට්ටම අඩු තත්ත්වයන් පැවතියද මෙම ක්ෂේත්‍රයේ අවුරුදු දෙකකට වඩා වැඩි පළපුරුද්ද ලබාගත් පුද්ගලයකුට න්‍යායාත්මක දැනුම පිළිබඳව අවබෝධයක් ලබාගැනීමට මෙම සහතික පත්‍ර පාඨමාලාව තුළින් හැකියාව ලැබෙන අතර අප ආයතනය තුළ දින 15ක් පුරාවට අධ්‍යාපනය ලබා දෙමින් මෙම සහතික පත්‍ර පාඨමාලාව පවත්වනු ලැබේ. සේවයේ නිරත පුද්ගලයන්ට සහභාගී විය හැකි පරිදි සති අන්තයේදී පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම ආයතනයන්හි ඉල්ලීම මත අප විසින් සති තුනක් පුරා නොකඩවා මෙම සහතික පත්‍ර පාඨමාලාව සිදු කරන අවස්ථාද ඇත.

දින 15ක අධ්‍යයන කාලය නිම වීමෙන් පසුව ඔවුන්ගේ දැනුම පරීක්ෂා කර බැලීමට විභාග පවත්වනු ලබන අතර ඒ අතරින් සමත්වන පිරිසට සහතික පත්‍ර ප්‍රදානය කිරීම සිදු කරනු ලැබේ. අධ්‍යයන පොදු සහතිකපත්‍ර උසස් පෙළ සුදුසුකම් සපුරා ඇති වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව උනන්දුවක් දක්වන ඕනෑම පුද්ගලයකුට මෙම පාඨමාලාව හැදෑරීමට අවස්ථාව අප විසින් ලබා දෙනු ලබයි.

■ තෙවන මට්ටම

ශ්‍රී ලංකාව තුළ සුරක්ෂිත වැඩබිම් බිහිකරවාලීම සඳහා අවශ්‍ය වන වෘත්තීය සුරක්ෂිතතා නිළධාරීන් බිහිකරනු වස් අප විසින් ක්‍රියාත්මක කරනු ලබන තෙවන මට්ටමේ පුහුණුවීම් හේතු

පාදක වන්නේය. ජාතික වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳව උසස් ඩිප්ලෝමා පාඨමාලාව හා ඩිප්ලෝමා පාඨමාලාව මේ සඳහා අයත් පුහුණුවීම් ලෙස දැක්විය හැකිය. මේ වන විට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාව අප විසින් පවත්වාගෙන යනු ලැබේ. ඒ සඳහා NVQ 05 තත්ත්ව සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.

කර්මාන්තයන්හි පවතින අවශ්‍යතා තක්සේරු කිරීමෙන් අනතුරුව ඩිප්ලෝමා පාඨමාලාව සකස් කර ඇත. මෙය මොඩියුල තුනකින් පවත්වන අතර ඒවා, වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය මොඩියුලය, වෘත්තීය ආරක්ෂණ මොඩියුලය සහ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය මොඩියුලය ලෙස සකස් කර ඇත. එක් එක් මොඩියුලයන් සඳහා අවශ්‍ය දැනුම මාස හතරක් පුරාවට ලබා දෙන අතර එක් එක් මොඩියුල අවසානයේදී ඒ සඳහා මොඩියුල විභාගය පවත්වනු ලැබේ. එසේම මොඩියුල තුනම අවසානයේදී තමා ලබාගත් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම උපයෝගී කරගනිමින් ව්‍යාපෘති වාර්තාවක් සකස් කළ යුතුව ඇත. අවසානයේ ව්‍යාපෘති වාර්තාවන් සමග VIVA සඳහා ඉදිරිපත් වී තමා ලබාගත් දැනුම පිළිබඳව විභාගයට ලක් කරනු ලැබේ. විභාගවලදී මෙන්ම ව්‍යාපෘති වාර්තාවට හා VIVA සඳහා ලබාගත් ලකුණු අනුව සලකා බලා ඔවුන් වෙත ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව ඩිප්ලෝමාව පිරිනමනු ලැබේ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාවට අවශ්‍ය කටයුතු ප්‍රතිපාදනය කරගනිමින් එම කටයුතු සකස් කිරීම මේ දිනවලදී සිදු කරනු ලැබේ. හැකි ඉක්මනින්ම ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව උසස් ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීම අපගේ අපේක්ෂාවයි.

ආ. ව්‍යාපෘති

ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා එක්ව මෙරට වැඩකරන ජනතාවගේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය ගොඩනංවාලීමට අදාළ වන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අප කටයුතු කරන්නෙමු. විදේශ ආධාර ලබා දෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ආධාර උපකාර වැඩකරන ජනතාව වෙත ලබා දීමට අවස්ථාව සලසාදීම මෙවැනි ව්‍යාපෘති මඟින් අප සිදු කරන්නෙමු.

ඇ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මාන උළෙල සංවිධානය කිරීම

වැඩකරන ජනතාව වෙනුවෙන් කැපවී කටයුතු කරන කර්මාන්තයන් ඇගයීමට ලක් කිරීම අප මෙතුළින් අපේක්ෂා කරන්නෙමු. නිවැරදි ලෙස තම සේවාදායකයන්ගේ සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය පිළිබඳව නිරන්තරයෙන්ම විමසුමට ලක් කරමින් ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම පිළිබඳව ඇගයීම මෙන්ම අනෙකුත් කර්මාන්තයන්ටද ඒවායේ ආදර්ශය ලබා දීම මෙමඟින් සිදුවේ. මෙවැනි සම්මාන උළෙලකදී සම්මාන ලබාගැනීමට කර්මාන්තයන් නිතැනින්ම කැමැත්තක් දක්වන අතර ඒ තුළින් ලංකාව පුරා සුරක්ෂිත වැඩබිම් ඉදිකිරීමට හැකියාවක් උදාවේ. සෑම වසර දෙකකට වරක් මෙම සම්මාන උළෙල පැවැත්වීමට අප කටයුතු සම්පාදනය කරන්නෙමු.

ඈ. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව සම්මන්ත්‍රණය සංවිධානය කිරීම

වැඩ කරන ජනතාවගේ සුරක්ෂිතභාවය පිළිබඳව සුරක්ෂිතතා නිලධාරීන් හට නව තාක්ෂණික දැනුම ලබා දීමට හා නව තාක්ෂණික උපකරණ ආදිය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව සම්මන්ත්‍රණ උළෙල සංවිධානය කරනු ලැබේ. මෙහිදී විදේශ සම්පත් දායකත්වයද ලබා ගනිමින් ඔවුන් සතු නව දැනුම අප රටට ලබා ගැනීමට අප කටයුතු කරන්නෙමු. තවද මෙහිදී න්‍යායාත්මක දැනුම මෙන්ම ප්‍රායෝගික පුහුණුවද සුරක්ෂිතතා නිලධාරීන් වෙත ලබා දීමට අප උත්සහ දරන්නෙමු.

ඉ. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණයන්හි නිරතවීම

දිනෙන් දින යාවත්කාලීන වන තොරතුරු පිළිබඳව වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් දැනුවත් කිරීම අප ආයතනයේ ප්‍රධාන කාර්යයන් වන බැවින් ඒ සඳහා පර්යේෂණ සිදුකරමින් නව තොරතුරු ලබා ගැනීමට සිදුවේ. මේ හේතුවෙන් වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව සිදුකරන පර්යේෂණයන් පිළිබඳව අප දැනුවත් වන අතරම ඒ සඳහා අපට හැකි දායකත්වය දීමටද අප නිරන්තරයෙන් කටයුතු කරන්නෙමු.

ඊ. වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් සඳහා ජාතික සංගමය පිහිටුවීම

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ වෘත්තිකයන්ට හා අපගේ සිසුන්ට අවශ්‍ය කටයුතු සඳහා අවස්ථාව ලබා දීම උදෙසා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය නිලධාරී ජාතික සංගමය පිහටුවන ලදි. කොළඹ හිල්ටන් හෝටලයේදී සමාරම්භක උළෙල පවත්වා මෙය ආරම්භ කරන ලදී. වෘත්තිකයන් හා සිසුන් වෙත වරප්‍රසාද ලබා දීම මෙමඟින් අපේක්ෂිතය.

උ. සුභසාධන කාර්යන්හි නිරත වීම

නොයෙක් අඩුපාඩුකම් හේතුවෙන් තමන්ට අවශ්‍ය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්පන්නභාව පවත්වාගත නොහැකි වෘත්තිකයන් උදෙසා සුබසාධන සේවාවන් සලසාදීමට අප නිරන්තරයෙන්ම කටයුතු කරන්නෙමු. එමෙන්ම පාසල් සිසුන් තුළ මනා සෞඛ්‍ය පුරුදු ඇති කිරීම උදෙසා නිරන්තර දැනුවත් කිරීම් සිදු කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් උදෙසා අප දායකත්වය ලබා දෙන්නෙමු. ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ස්ථාපිත කරනු වස් අවශ්‍ය සෑම අවස්ථාවකදීම ඉදිරිපත් වී එම ජාතික වගකීම අප කර මතට ගෙන කටයුතු කිරීමට අප ඇපකැපවී සිටින්නෙමු.

2.1.3 ජාත්‍යන්තර සහයෝගිතාව

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව ජාත්‍යන්තරය හා සම්බන්ධ වී කටයුතු කිරීමට අප වගබලා ගන්නෙමු. ජාත්‍යන්තර ආයතන සමඟ උරෙනුර ගැටෙමින් ඔවුන් හා එක්ව යමින් ජාත්‍යන්තරයේ සහයෝගය අප රට වෙත ලබාගැනීමට අප නිරන්තරයෙන්ම උත්සහා දරන්නෙමු. එහි ප්‍රතිඵලයක් වශයෙන් විදේශීය වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන සමඟ කටයුතු කිරීමට අප ආයතනයට අවස්ථාව හිමිවී තිබේ.

2.2 සේවා පහසුකම් දියුණු කිරීම

අප ආයතනයේ ප්‍රමිතිය ඉහළ මට්ටමට නංවා ගැනීම උදෙසා මෙන්ම භෞතික පහසුකම් දියුණු මට්ටමකට ගෙන ඒමට අප නිරන්තයෙන්ම උත්සහ දරන්නෙමු. එහිදී ආයතනයේ ප්‍රමිතිය පවත්වා ගැනීමට ආයතනයේ සේවා පරිසරය ද වැඩ කිරීමට යෝග්‍ය පරිදි ගොඩ නංවාලීමට අවැසි කටයුතු සම්පාදනය කිරීමට අප වගබලා ගන්නෙමු.

2.2.1 ආයතනයේ ප්‍රමිතිය ඉහළ නංවා ගැනිමට අවශ්‍ය තත්ත්ව සහතික ලබා ගැනීම

අපගේ පුහුණු වැඩසටහන් ඉතාම ඉහළ මට්ටමේ ප්‍රමිතියක් යටතේ අප විසින් සිදු කරනු ලැබේ. ඒ සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිති සහතික අප වෙත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මෙහිදී සිදු කරනු ලැබේ. ISO තත්ත්ව සහතිකය මෙන්ම NVQ සහතිකය අප ආයතනය වෙත ලබා ගැනීමට හැකියාව උදාවී තිබීම පිළිබඳව අප තුළ ඇත්තේ අවිහිංසක සතුටකි.

2.2.2 ආයතනයේ භෞතික පහසුකම් දියුණු කිරීම

වෘත්තිකයන්ට ප්‍රිය මනාප පරිසරයක් නව සේවා පරිසරය තුළ ගොඩනැංවීමට උපදෙස් සපයන අප ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය තුළ සේවා පරිසරයද ප්‍රියමනාප පරිසරයක් ලෙස සකස් කිරීමට උත්සහ කරන්නේ අප ආයතනයේ සේවකයින්ට ප්‍රියමනාප පරිසරයක් තුළ සේවාවන් ඉටු කිරීමට අවස්ථාව ලබා දීමට මෙන්ම, වෘත්තිකයන්ට හිතකර පරිසරයක් ගොඩනංවාදීමේ අවශ්‍යතාව ක්‍රියාවෙන්ම සනාථකර දීමටයි.

තෙවන පරිච්ඡේදය

ආයතනයේ ප්‍රගතිය

ආයතනයේ ප්‍රගතිය

3.1 සේවා සැපයීමේ ප්‍රගතිය

දෛනික කාර්යයන් ලෙස සිදු කරනු ලබන පාරිසරික මිනුම් සමීක්ෂණ 206ක් සිදු කිරීමට 2019 වර්ෂයේ දී අවස්ථාව උදාවිය. පර්යේෂණ 150 ක් සිදු කිරීමට අපේක්ෂා කරනු ලැබුවද අපේක්ෂිත පර්යේෂණ ප්‍රමාණයට වඩා පර්යේෂණ 56ක් සිදු කිරීමට අවස්ථාව උදාවිය. 3.1 වගුව ඇසුරෙන් අප සිදු කරනු ලැබූ සේවාවන් පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිය.

පාරිසරික සමීක්ෂණ	ආයතන ප්‍රමාණය
ශබ්දය	185
ආලෝකය	175
උෂ්ණත්වය	175
දූවිල්ල	187
වාතය පිළිබඳ සමීක්ෂණ	172

වගුව 3.1 පාරිසරික මිනුම් සමීක්ෂණ

සේවයේ නිරත වෘත්තිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය නිසියාකාරව පවතිනවාද යන්න තීරණය කිරීමට වෛද්‍ය පර්යේෂණ සිදු කරනු ලැබීය. 2019 වර්ෂයේදී වෛද්‍ය පර්යේෂණ 679ක් අප ආයතනය විසින් සිදු කරන ලදී. වෘත්තීය අවදානම් තත්ත්වය හඳුනාගෙන ඒ පිළිබඳව අදාළ ආයතනය දැනුවත් කිරීම අවදානම් කළමනාකරණ වැඩසටහන තුළින් සිදු කරනු ලැබේ. 2016 - 2019 වර්ෂය දක්වා සිදුකරන ලද පාරිසරික මිනුම් සමීක්ෂණ, වෛද්‍ය පර්යේෂණ, අවදානම් හඳුනාගැනීමේ වැඩසටහන්වල ප්‍රගතිය පහත 3.1 ප්‍රස්තාරය තුළින් පෙන්වා දිය හැකිය.



ප්‍රස්තාරය 3.1 - 2016 - 2019 දක්වා සිදු කරන ලද පරීක්ෂණ

3.1.2 විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය

සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිළධාරීන් පුහුණු කිරීම අප ආයතනය විසින් සිදු කරන විශේෂ වැඩසටහනකි. 2019 වර්ෂයේ දී සිදු කරන ලද විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය පහත වගුව තුළින් දැක්විය හැකිය.

මට්ටම	වැඩසටහන	කාල පරිච්ඡේදය
තෙවන මට්ටම	ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව	2019 පෙබරවාරි 23 2019 සැප්තැම්බර් 22
දෙවන මට්ටම	ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	2019 ජනවාරි 19 2019 පෙබරවාරි 06 2019 මාර්තු 05 - 27 2019 අගෝස්තු 03 2019 අගෝස්තු 07 2019 නොවැම්බර් 22
පළමු මට්ටම	ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වැඩමුළුව	2019 පෙබරවාරි 27 2019 නොවැම්බර් 27-29
	අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ එක්දින වැඩමුළුව	2019 ජූලි 12 2019 ජූලි 12
	අබාන්ස් ආයතනයේ සේවකයින් සඳහා වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ දෙදිනක දැනුවත් කිරීමේ වැඩසටහන	2019 නොවැම්බර් 21
	හෙදියන් සඳහා වූ එක්දින වැඩමුළුව	2019 ජූලි 19
	ඇඟලුම් ක්ෂේත්‍රය සඳහා වූ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ එක්දින වැඩමුළුව	2019 මාර්තු 31
	විදුලි ආරක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ දෙදින වැඩමුළුව	2019 අප්‍රේල් 02-03 2019 ඔක්තෝබර් 02-03
	සුපරීක්ෂකවරුන් සඳහා වූ එක්දින සුරක්ෂිතතා වැඩමුළුව	2019 මාර්තු 28
	අනාරක්ෂිතභාවය හා අනතුරු සහිත ස්ථානවල වැඩකිරීම පිළිබඳ එක්දින වැඩමුළුව	2019 ජූනි 11 - 12
	ප්‍රථමාධාර පිළිබඳව දෙදින වැඩමුළුව	2019 නොවැම්බර් 28 - 29
	ගුරුවරුන් සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළුව	2019 දෙසැම්බර් 05 - 28

වගුව 3.1.2: විශේෂ වැඩසටහන්වල ප්‍රගතිය

2019 වර්ෂයේ දී කණ්ඩායම් දෙකක් වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කරන ලදී. 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රගතිය පහත වගුව තුළින් පෙන්වාදිය හැකිය.

ජාතික සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව



ප්‍රස්ථාරය 3.2 - 2012 වර්ෂයේ සිට 2019 වර්ෂයේ දක්වා ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රගතිය

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව සහතික පත්‍ර පාඨමාලා 6ක් 2019 වර්ෂයේ දී සාර්ථකව නිමකරන ලදී. කර්මාන්තයන්හි සහ ආරක්ෂක අංශවල පවතින දැඩි ඉල්ලුම මත සහතික පත්‍ර පාඨමාලා 6ක් සිදු කිරීමට අප හට අවස්ථාව උදාවිය.

ජාතික සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව



ප්‍රස්ථාරය 3.3 - 2012 වර්ෂයේ සිට 2019 වර්ෂයේ දක්වා ඩිප්ලෝමා පාඨමාලාවේ ප්‍රගතිය

අප ආයතනයෙන් සිදු කරනු ලබන විශේෂ පුහුණු පාඨමාලාවන් ලෙස පදනම් පාඨමාලාව (Foundation Course) මුල්වරට ආරම්භ කරනු ලැබුවේ 2019 වර්ෂයේදීය. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව උනන්දුවක් දක්වන අ.පො.ස. උසස් පෙළ නිම කරන ලද සිසුන් සඳහා අවස්ථාව උදාකර දීම මේ තුළින් අපේක්ෂා කරන්නෙමු. 2019 ජුනි මස 10 වන දින පටන් 2019 ජුනි මස 21 දින දක්වා මේ සඳහා දේශණ පවත්වන ලදී. ඒ ඇසුරෙන් ඔවුන් සඳහා විභාගයක්ද පවත්වා සමත් වූ සිසුන් සඳහා 2019 අගෝස්තු මස 08 වන දින සහතිකපත් ප්‍රදානය කිරීමේ උළෙලක්ද පවත්වන ලදී. මෙම පාඨමාලාව හදාරනු ලැබූ

සිසුන් අද වන විට පුහුණු සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිළධාරීන් ලෙස ක්ෂේත්‍රයේ කටයුතු කරනු දක්නට ලැබේ. ප්‍රථම වරට 2019 ආරම්භ කරන ලද මෙම පදනම් පාඨමාලාව සෑම වසරක් පුරාවටම පවත්වා ගෙනයාමට අපේක්ෂිතය.

3.1.3. ව්‍යාපෘති වැඩසටහන්වල ප්‍රගතිය

මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් සමස්ත රැකියාවෙන් 60% කට වඩා වැඩි ප්‍රමාණයක් ආවරණය කරන අතර එය ජාතික දළ දේශීය නිෂ්පාදිතයට වැඩි දායකත්වයක් සපයයි. මෙම කර්මාන්ත, ආහාර, කෘෂිකර්මාන්තය, උද්‍යාන විද්‍යාව, ඩීවර කර්මාන්තය, ගඩොල් සෑදීම යනාදියෙන් ආරම්භ වන විවිධාකාර කාර්මික කාණ්ඩ ආවරණය කරයි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බොහොමයක් පවත්වාගෙන යනු ලබන්නේ කුඩා ව්‍යාපාර හිමියන් වන අතර සේවායෝජක සේවක හිවිසුම් මෙම අංශයේ දැකිය නොහැක. ඒ අනුව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගෙන් බොහෝ දෙනෙක් මූල්‍ය කළමනාකරණය සම්බන්ධ ගැටළුවලට මුහුණ දෙන අතර සේවක / සේවකයින්ගේ සෞඛ්‍ය ගැටළුවලට ඔවුන් වැඩි අවධානයක් යොමු නොකරයි. එබැවින් මෙම කර්මාන්තවල ආරක්ෂාව සහ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම කාලෝචිත අවශ්‍යතාවයකි.

ව්‍යාපෘතියේ පරමාර්ථ

2019-2020 වර්ෂය තුළ තෝරාගත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ආරක්ෂාව සහ සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු කිරීම. ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) විසින් ලබා දී ඇති අරමුණු ඉටු කර ගැනීම සඳහා අප විසින් පහත සඳහන් උපායමාර්ග ක්‍රියාත්මක කරන ලදී.

- තෝරාගත් කර්මාන්ත අතර ආරක්ෂිත හා සෞඛ්‍ය විගණනයක් පැවැත්වීම
- ඉහත සඳහන් කර්මාන්තවල ඇති අවදානම් හඳුනා ගැනීම
- වැඩි දියුණු කිරීම් සඳහා නිර්දේශ ලබා දීම
- වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව වැඩිදියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය අදියර දෙකකින් ක්‍රියාත්මක වේ. පළමු අදියර වූයේ යාපනය සහ වවුනියා දිස්ත්‍රික්කවල තෝරාගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අතර වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව විගණනය කිරීමයි. මෙම ව්‍යාපෘතිය සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 10ක් ILO විසින් තෝරා ගන්නා ලදී. සියලුම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අප විගණකවරුන් කණ්ඩායමක් පැමිණ ඇති අතර එහි වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපාර සංවර්ධන උපාය මාර්ගයක් ලෙස වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ලබා දෙන ලදී.

ව්‍යාපෘතියේ දෙවන පියවර වූයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හිමිකරුවන්, ආණ්ඩුකාරවරුන් සහ කම්කරු නිලධාරීන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමයි. එය දින 3ක් යාපනයේ දී පවත්වන ලදී. සහභාගිවන්නන් අතර බෙදා හැරීම සඳහා ඉතා සරල අත්පොතක් සකස් කරන ලදී.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මාන උළෙල 2019

වැඩ කරන ශ්‍රී ලාංකික ජනතාවට වැඩබිමේ දී සිදුවන අනතුරු හා රෝගාබාධ වළක්වාලීම හා එම අනතුරුවලින් සිදුවන හානිවීම් අවම කිරීම සඳහා වැඩබිම් පරිසර සම්බන්ධයෙන් කැප වී ක්‍රියා කළ ආයතන ඇගයීමේ අරමුණින් NIOSH ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය විශිෂ්ඨතා සම්මානය 2018 තෙවන වරටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී

ජනරජයේ අග්‍රාමාත්‍යතුමා හා කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අගෝස්තු මස 22 වන දින නෙළුම් පොකුණ රඟහලේදී ප.ව. 5.00ට පැවැත්වූ අතර මේ සඳහා දිවයින පුරා පිහිටි විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන සේවය සේවක දෙපාර්ශවයන් 1500ට අධික ප්‍රමාණයක් සහභාගි විය.

ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පුහුණුව ලබාදෙන කර්මාන්තශාලා ඇගයීමට ලක්කිරීම මූලික පරමාර්ථයයි. NIOSH මඟින් පවත්වන ලද තුන්වන සම්මාන උළෙල මෙය වූ අතර අපක්ෂපාතී ලෙස මෙහි සම්මානලාභීන් තෝරා ගන්නා ලදී. ප්‍රධාන අදියර 3ක් මත පදනම්ව සම්මානලාභීන් තෝරාගන්නා ලදී.

පළමු අදියර ලෙස තේරීම් කමිටුව විසින් ආයතන විසින් සම්පූර්ණ කර එවනු ලැබූ ලියවිලි නිර්ණායකයන්ට අදාළව තිබේදැයි පරීක්ෂාකර බලන ලදී. දෙවන අදියර ලෙස පළමු පියවරෙන් තෝරාගනු ලැබූ ආයතන වෙත විශේෂඥ කණ්ඩායමක් යොදවා නිරීක්ෂණය කර ලකුණු ලබාදී සුදුසු ආයතන තෝරාගනු ලැබීය. එසේ තෝරාගනු ලැබූ කර්මාන්තශාලා විශිෂ්ඨ විශේෂඥ මණ්ඩලයක් වෙත ඉදිරිපත් කර සම්මානලාභීන් තෝරා ගනු ලැබීය. සෑම කර්මාන්ත අංශයක්ම, උදාහරණ වශයෙන් නිෂ්පාදන, හෝටල්, අහාරපාන අංශ, ඇඟළුම් අංශ, ප්‍රවාහන අංශ, රෝහල් අංශ යන අංශ සඳහා සමාන අවස්ථාවන් ලබා දී ඇත. තවදුරටත් බහු ජාතික සමාගම් සහ දේශීය මහා පරිමාණ ව්‍යාපාර දේශීය, මධ්‍යම පරිමාණ ව්‍යාපාර, දේශීය සුළු පරිමාණ අංශවලට මෙතුළින් අවස්ථාව ලබාදෙන ලදී.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳව සම්මන්ත්‍රණය 2019

අමාත්‍ය මණ්ඩලය මඟින් සෑම වර්ෂයකම ඔක්තෝබර් මස 2 වන සතිය රැකියාවල නියුක්ත වෘත්තිකයන්ගේ සෞඛ්‍ය හා සුරක්ෂිතතාවය තහවුරු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය ලෙස ප්‍රකාශයට පත් කොට ඇත.

















ඡායාරූපය 3.1 - වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ සම්මාන උළෙල

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය 2019

මෙවර ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය 2019 ඔක්තෝබර් මස 14 වන දින සිට ඔක්තෝබර් 19 වන දින දක්වා පැවැත්වූ අතර ඒ සම්බන්ධයෙන් පහත ක්‍රියාකාරකම් සිදු කිරීමට අප ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් කටයුතු කරන ලදී.

1. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය - 2019 ඔක්තෝබර් 14 පැවැත්විණි.

2. වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් සඳහා වන ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය - 2019 ඔක්තෝබර් 14 දින පැවැත්විණි.

3. වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් සඳහා වන සහතිකපත්‍ර ප්‍රධානෝත්සවය - 2019 ඔක්තෝබර් 14 වන දින පැවැත්විණි.

4. වෘත්තීය සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම - 2019 ඔක්තෝබර් 16 වන දින සිට 19 වන දින තෙදින පුරාවට වැඩසටහන් පවත්වන ලදී. (ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ නව ශ්‍රවණාගාරයේ හා දේශන ශාලාවේ)

මෙම සම්මන්ත්‍රණය 2019 ඔක්තෝබර් 14වන දින පවත්වන ලදී. විදේශීය හා දේශීය දේශකවරුන්ගේ සහභාගීත්වයෙන් මෙම සම්මන්ත්‍රණය පවත්වන ලදී. නව තාක්ෂණය වෘත්තිකයන්ගේ සුරක්ෂිතතාවය නංවාලීමට යොදා ගන්නේ කෙසේද යන්න පිළිබඳව දැනුවත් කිරීම සිදුවිය. සේවයේ නියුක්ත 400 වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් ඉතාමත් සාර්ථක ලෙස සම්මන්ත්‍රණය නිම කිරීමට අවස්ථාව උදාවිය. මෙහි විශේෂත්වය වුයේ වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳව විදේශීය දේශකයන්ගේ සහභාගීත්වයෙන් සිදුවූ අතර ඔවුන්ගේ දැනුම හා අත්දැකීම් ලාංකික කර්මාන්තශාලාවන්හි සේවයේ නියුතුවූවන් හා බෙදා ගැනීමට අවස්ථාව උදාවිය. මැලේසියාවේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනයේ නියෝජනය කරමින් එහි සාමාජිකයන්ද මේ සඳහා සහභාගී විය.





















ඡායාරූපය 3.2 - වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ සම්මන්ත්‍රණ උළෙල

වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් සඳහා වන ඩිප්ලෝමා ප්‍රධානෝත්සවය 2019

වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් සඳහා වන ඩිප්ලෝමා හා සහතිකපත්‍ර ප්‍රධානෝත්සවය අමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2019 ඔක්තෝබර් 14වන දින ප.ව 6.00 සිට කොළඹ ෂැංග්‍රිලා හෝටලයේ දී පවත්වන ලදී. එහිදී ඩිප්ලෝමා පාඨමාලාව නිමවූ 135 දෙනෙක් හා සහතිකපත් පාඨමාලාව නිමවූ 85 දෙනෙක් වෙත සහතිකපත් ප්‍රදානය කරන ලදී.












3.3 ඡායාරූපය - ඩිප්ලෝමා හා සහතිකපත්‍ර ප්‍රදානය කිරීමේ උළෙල

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සෞඛ්‍ය සම්මේලනය 2019

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය පදනම් කරගනිමින් මෙම වැඩසටහන පවත්වන ලදී. ඔක්තෝබර් මස 16, 17 සහ 19 යන දින තුන පුරාවට මෙය පවත්වන ලදී. එහිදී එක් දිනකට වැඩ සටහන් තුන බැගින් දවස් තුන පුරාවට වැඩසටහන් නවයක් පැවැත්වීමට කටයුතු කරන ලදී. එක් එක් දිනයන්ට ප්‍රධාන ආරාධිතයකු සමඟ උදෑසන වැඩසටහන මෙහෙයවන ලදී. එහිදී ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස මෝටර් රථ ධාවනශූර ඩිලන්ත මාලගමුව මහතා, ජාතික රෝහලේ හදිසි අනතුරු අංශයේ හෙද නිලධාරිණියක් ලෙස කටයුතු කරන පුෂ්පා රම්‍යානි මෙනෙවිය ආදී පුද්ගලයන් සහභාගී කරගැනීමට හැකියාව උදාවිය. වෘත්තීය සුරක්ෂිතතා සතිය පදනම් කරගනිමින් පවත්වනු ලැබූ මෙම වැඩසටහන් මාලාව සඳහා සෑම දිනකම 120 දෙනෙකුට වැඩි පිරිසකගේ සහභාගීත්වයක් තිබිණි. තවද බන්ධනාගාර නිළධාරීන් උදෙසා ඔවුන් වෙනුවෙන් වෙනම වැඩසටහනක් පවත්වන ලදී. එහිදී බන්ධනාර කොමසාරිස්තුමාගේ මූලිකත්වයෙන් ලංකාව පුරා සිටින බන්ධනාගාර නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. ඔවුන් තුළින් බන්ධනාගාර රැඳවියන් දැනුවත් කිරීමට අපේක්ෂා කරන ලදී.



ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය න්‍යාය පත්‍රය













ඡායාරූපය 3.4 - ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සතියේ පවත්වන ලද වැඩසටහන

වෘත්තීය සුරක්ෂිතතා ජාතික සංගමය

අපගේ සිසුන්ට සහ අනෙකුත් වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳව වෘත්තිකයින්ට අවස්ථා ලබා දීම සඳහා වූ ජාතික ආයතනය NSPA ය. අපගේ සියලුම සාමාජිකයන් ජාලගතකර සංගමයක් සංවිධානය කිරීමට තීරණය කරන ලදී. සමාරම්භක සැසිය කොළඹ පැවැත්විණි. සාමාජික සංගමයේ අරමුණු සහ විශේෂ තාක්ෂණික සැසියක් 2018 වර්ෂය තුළ සංවිධානය කරන ලදී. 2019 වර්ෂය තුළ සාමාජිකත්වය වැඩි කරන ලද අතර සාමාජික කාණ්ඩ සංවර්ධනය කර ක්‍රියාකාරී කණ්ඩායම් සංවර්ධනය කරන ලදී. කණ්ඩායමේ ජාලකරණය "ට්විස් ඇප්" කණ්ඩායම හරහා සිදු කරන ලද අතර බොහෝ තොරතුරු එහි සාමාජිකයින් සඳහා ඉතා ඉක්මණින් බෙදා හරින ලදී.

3.1.4 ජාත්‍යන්තර සහයෝගිතාව

අන්තර්ජාතික පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට 2019 අවස්ථාව උදාවිය.

3.2 සේවා පහසුකම් දියුණු කිරීමේ ප්‍රගතිය

වෛද්‍ය පරීක්ෂණ පවත්වනු ලබන පරීක්ෂණාගාරය අඩු පහසුකම් යටතේ පරිහරණයට නුසුදුසු ආකාරයට පැවතුණි. එය නවීන පහසුකම් යටතේ නැවත පිළිසකර කර ගැනීමට 2019 වර්ෂයේදී අපට හැකියාව උදාවිය. එමෙන්ම නව පහසුකම් යටතේ 90 දෙනෙකුට පමණ අසුන්ගත හැකි නවීන දේශණ ශාලාවක් ඉදිකිරීමද මේ වර්ෂයේදී සිදුකරන ලදී. අප ආයතනයේ පාඨමාලා හදාරන ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබා ගැනීමට අවශ්‍ය සියලු පහසුකම් ලබාදීම ගොඩනැගිලි නවීකරණය කිරීමෙන් බලාපොරොත්තු විය. 2019 වර්ෂයේ මාර්තු මාසය වනවිට මෙම කටයුතු නිම කරන ලදී.

නව පරීක්ෂණාගාරය හා දේශණාගාරය විවෘත කිරීම නිමිත්තෙන් ආයතනයේ සර්ව රාත්‍රික පිරිත් පිංකමක්ද සංවිධානය කරනු ලැබීය. ආයතනයේ ඉදිරි කටයුතු සාර්ථක කරගැනීමට ආශිර්වාද එක් කරමින් 2019 අප්‍රේල් මස 05 වන දින ආයතනයේ සියලු දෙනාගේම සහභාගීත්වයෙන් පිරිත් පිංකම පවත්වන ලදී

ISO සහතිකය සහ NVQ (LEVEL) 05 ලබා ගැනීම

වාර්ෂිකව අලුත් කරගත යුතු ISO සහතිකය නියමිත ක්‍රම අනුගමනය කරමින් පවත්වන ලද විගණනයෙන් පසුව 2019 වර්ෂයේ දී ද අප විසින් ලබාගන්නා ලදී. වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සඳහා වන ජාතික ඩිප්ලෝමාව සඳහා NVQ (LEVEL) 05 ලබා ගැනීමට ද 2019 වර්ෂයේ දී අවස්ථාව උදාවිය. ජාතික ඵලදායිතා සම්මාන සඳහා 2020 වර්ෂයේ දී අයදුම් කිරීමට අපේක්ෂාවෙන් සිටින්නෙමු.













ඡායාරූපය 3.5 - නවීකරණය කරන ලද
කාර්යාල පරිශ්‍රය හා දේශන ශාලාව

සිව්වන පරිච්ඡේදය

ආයතනයේ සුවිශේෂ ජයග්‍රහණ

ආයතනයේ සුවිශේෂී ජයග්‍රහණ

1. ඉලක්කගත පාරසරික මිනුම් සමීක්ෂණ 140ක ප්‍රමාණයක් සිදුකිරීමට බලාපොරොත්තු වුවද 200 ප්‍රමාණය සිදු කිරීමට හැකියාව උදාවිය. අපේක්ෂිත අවදානම් ඇගයීම් පරීක්ෂණ ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක් සිදු කිරීමට හැකි විය

2. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා දෙකම සාර්ථකව නිමකළ හැකි විය

3. ජාත්‍යන්තර කම්කරු සංවිධානය හා එක්ව වැවිලි කර්මාන්තය සඳහා වූ ව්‍යාපෘතියක් සාර්ථකව නිම කරලීමට අවස්ථාව උදාවීම

4. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සම්මන්ත්‍රණය සාර්ථකව පැවැත්වීම

5. ජංගම සෞඛ්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය නවීන පන්නයේ වෑන් රථයක් මිළදී ගැනීමට හැකිවීම

පස්වන පරිච්ඡේදය

ආයතනයේ මූල්‍ය විශ්ලේෂණය

ආයතනයේ මූල්‍ය විශ්ලේෂණය

	2019 (රු)	2018 (රු)
වෘත්තීය සුරක්ෂිතතා පාඨමාලාවලින් ලද ආදායම	24,399,651.00	20,036,775.00
පාරිසරික මිනුම්වලින් ලද ආදායම	13,797,050.00	12,338,240.00
වෙනත් ආයතන සමඟ ඇති කරගත් සහයෝගීතා ගිවිසුම් තුළින් සපයනු ලැබූ සේවා සඳහා ලබාගත් ආදායම	3,831,365.00	6,923,981.00
වෛද්‍ය පරීක්ෂණ කටයුතු තුළින් ලද ආදායම	2,220,710.00	2,891,360.00
වෘත්තීය සෞඛ්‍ය සුරක්ෂිතතා සතිය තුළින් ලද ආදායම	13,317,793.00	3,798,680.00
පොළී ආදායම	11,628,062.00	10,404,473.00
NIOSH සමාජිකත්ව ආදායම	62,250.00	77,250.00
වෙනත් ආදායම්	468,260.00	260,302.00
එකතුව	69,725,171.00	56,731,061.00

වගුව 5.1 ආයතනයේ මූල්‍ය විශ්ලේෂණය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. එල්ඊඩබ්/ඒ/එන්අයිඑස්එච්/01/2019/01

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2020 ඔක්තෝබර් 12 දින

සභාපති,
ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය.

ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 නත්වාගණනය කල මතය

ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, නිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ නත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 නත්වාගණනය කල මතය සඳහා පදනම්

(අ) ආයතනය වර්තමානයේ ජාවත්ත ප්‍රදේශයේ කම්කරු දෙපාර්තමේන්තුවට අයත් හෙක්ටයාර් 0.1840 ක භූමිභාගයක ඉදිකරන ලද ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දක්වා ආයතනය විසින් රු.21,140,552 ක් වැය කර තිබුණි. 2020 අගෝස්තු 05 දින වන විටත් වත්කමේ අයිතිය ආයතනය වෙත පවරාගෙන නොතිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි ඡේද 87(9) ප්‍රකාරව ආයතනය පවත්නා ඉඩම් හා ගොඩනැගිලිවල අයිතිය නොමැතිවීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naod.gov.lk

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව භාවිතා කළ කාලයට පමණක් වත්කම් ක්ෂය කලයුතු වුවත් ආයතනය විසින් වත්කම් මිලට ගන්නා වසරේදීත් විකුණන වර්ෂයේදීත් සම්පූර්ණයෙන් ක්ෂය කිරීමේ පදනම මත වත්කම් ක්ෂය කර තිබුණි. එම නිසා ප්‍රවර්ථන වර්ෂය තුලදී මිලට ගන්නා ලද , පිරිවැය රු.6,692,704 ක් වූ වත්කම් අයිතම15 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර තිබුණු අතිරික්ත ක්ෂය වියදම රු.374,104 ක් වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණු පිරිවැය රු.7,132,880 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වී තිබුණු ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කම්කරු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල් ලෙස රු.7,623,444 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද කම්කරු අමාත්‍යාංශයේ එදිනට මූල්‍ය ප්‍රකාශන අනුව එම බැරකම රු.4,074,197 ක් ලෙස දක්වා තිබුණි. එසේ වුවත් මෙකී රු.3,549,247 ක වෙනසට හේතු හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 2 ට පටහැනිව, මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ වන ශුද්ධ මුදල් ප්‍රවාහයන් පිළිවෙලින් රු.165,000 ක්, රු.6,800,844 ක් සහ රු.11,963,481 ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනයේදී අනාවරණය කරන ලද රු.3,021,272 ක් වූ වැරදි නිවැරදි කර තිබූ නමුත් එම වැරදි නිවැරදි කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 47,48 හා 50 හි සඳහන් නියමයන්ට අනුව අතීතානුයෝගීව ගලපා සංසන්දනාත්මක සංඛ්‍යා (Restated comparative Figures) මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ආවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් කැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් වීය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමෙදී හා තක්සේරු කිරීමෙදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ

මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවිය හැකි බලපෑමට වඩා වංචාවකින් සිදු විත්තා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, වෙනතාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිහෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම්, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සම්බ අනුරූප බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට කරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනායාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකාරකම් කර ඇති බව.

නීතිරීති රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) අංක 03/2018 හා 2018 ජූලි 18 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ I (ආ) සහ II	i. ආයතනයේ සේවකයින්ට ගෙවනු ලබන දීමනා වැඩිකිරීම්, මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය සහ නිර්දේශ සහිතව කලයුතු වුවත් එම අනුමැතීන් රහිතව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන රු.369,894 ක මුදලක් ගෙවීම් කර තිබුණි.
	ii. ආයතනය විසින් පවත්වන පාඨමාලා සඳහා සහභාගී වන සමිපත්දායකයින් හට දීමනා ගෙවීම් කිරීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් අනුමතකර තිබුණද සීමාවන් ඉක්මවා දේශකයන් වෙත රු.1,022,750 ක මුදලක් අනුමැතියෙන් තොරව ගෙවා තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇචිනා කර නොමැති බව

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතනයේ ණයගැති ශේෂය රු.9,265,761 ක් වූ අතර ණයගැති කාල වීශ්ලේෂණය අනුව ඉන් රු.3,348,710 ක් දින 90 ට වඩා වැඩි ණයගැති ශේෂයන් පැවතුණද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොසිටුණි.

(ආ) අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව රුධිර සාම්පල පරීක්ෂාව සිදු කිරීම සඳහා 2015 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණි. මෙම ආයතනය අවම මිල ගණන් යටතේ මෙම සේවාව සැපයීම නිසා පරීක්ෂණ වර්ග 3 ක් සඳහා වන ගාස්තු රු. 300 බැගින් වැඩි කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නැවත මිල ගණන් කැඳවීමකින් තොරව මෙකී ආයතනයෙන් 2014 වර්ෂයේ සිට සේවාව ලබාගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ප්‍රදානය කර මාස 6 ක් ඉකුත් නොවූ විට පමණක් නැවත ඇනවුම් කිරීම සිදුකළ යුතු වුවත්, 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වසර 05 ක් අඛණ්ඩව මෙම ආයතනය මාර්ගයෙන් පමණක් රුධිර පරීක්ෂණ කටයුතු සිදු කරගෙන තිබුණි. 2019 වර්ෂය තුලදී පමණක් පරීක්ෂණ කටයුතු වෙනුවෙන් අවස්ථා 16 කදී රු. 384,990 ක මුදලක් ගෙවීම් කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

1.4 මූල්‍ය ප්‍රකාශන

1.4.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගණුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාල වන වාර්තාකරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගණුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කරණ කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

1.4.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) <u>රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01</u> මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් සඳහා වූ විස්තරාත්මක උපලේඛණය අනුව ගොඩනැගිලි යටතේ වර්ෂයේ කපාහල / අඩුකල අගය (Disposal) ලෙස රු.554,580 ක් දක්වා තිබුණි. 2018 වර්ෂයේදී	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	2018 වර්ෂයේ දී මිළදී ගනු ලැබූ පුද්ගල ආකෘති (Dummies) වැරදිමකින් ගොඩනැගිලි ගිණුමේ රුපියල් 554,580/= ලෙස සටහන් වී තිබුණි. 2019 වර්ෂයේ දී	වත්කම් මාරුකිරීම් නිවැරදිව ගිණුම්වල නිරූපණය කළයුතු බව

(ii) ප්‍රවර්ධන වර්ෂයේදී නිපුණතා සංවර්ධන රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය විසින් රු.3,829,489 ක මුදලක් ලබා දුන් බවට ප්‍රාග්ධන ප්‍රතිපූර්ණ (Capital Reimbursement) ගිණුමේ දක්වා තිබුණි. නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එම මුදල් ලැබීම් රු.15,792,970 ක් ලෙස දක්වා තිබීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ලද මුදල් ප්‍රවාහය රු.11,963,481 ක් වැඩියෙන් දක්වා තිබුණි.	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.15,792,790 ක් ලෙස ගනු ලැබුවේ 2018 වර්ෂයේ භාණ්ඩාගාර ලැබීම් ලෙස රු.5,682.291 හා 2019 වර්ෂයේ භාණ්ඩාගාර ලැබීම් රු.21,454,998 අතර වෙනසය.	ප්‍රමිතය ප්‍රකාරව මුදල් ප්‍රවාහය සකස් කිරීමට ආයතනය කටයුතු කලයුතු බව
(iii) සමාලෝචිත වර්ෂයේ සත්‍ය වශයෙන් මුදලින් ලද පොලී ආදායම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒම් ලෙස දැක්විය යුතු වුවද ආයතනය විසින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව වර්ෂය සඳහා වූ පොලී ආදායම මුදල් ගලා ඒම් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ මුදල් ප්‍රවාහය රු.209,156 කින් වැඩියෙන් දක්වා තිබුණි.	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	විගණනයේ සඳහන් පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශ සැසඳීමේදී සිදුව ඇති දෝෂ හා ප්‍රමිතවලට අනුකූලව ඉදිරි වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ සෑදීමේදී සැලකිල්ලට ගැනීමට ගණකාධිකාරී වෙත උපදෙස් ලබා දුනි.	ප්‍රමිතය ප්‍රකාරව මුදල් ප්‍රවාහය සකස් කිරීමට ආයතනය කටයුතු කලයුතු බව
(iv) ආදායම් ප්‍රකාශය අනුව වාර්ෂික ක්ෂය වියදම රු.4,918,487 ක් වුවද මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ප්‍රවාහය සෙවීමේදී රු.5,083,486 ක් ලාභයට එකතු කිරීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම්	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	විගණනයේ සඳහන් පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීමේදී සිදුව ඇති දෝෂ හා ප්‍රමිතවලට අනුකූලව ඉදිරි වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශ	ප්‍රමිතය ප්‍රකාරව මුදල් ප්‍රවාහය සකස් කිරීමට ආයතනය කටයුතු කලයුතු බව

යටතේ මුදල් ප්‍රවාහය රු.165,000 ක් වැඩියෙන් නිරූපණය කර තිබුණි.			සෑදීමේදී සැලකිල්ලට ගැනීමට ගණකාධිකාරී වෙත උපදෙස් ලබා දුනි.	
(ඇ) <u>රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03</u> 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනයේදී අනාවරණය කරන ලද රු.3,021,272 ක් වූ වැරදි නිවැරදි කිරීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 46, 47 සහ 50 හි සඳහන් නියමයන්ට අනුව අතීතානුයෝගීව ගලපා සංසන්ධනාත්මක සංඛ්‍යා (Restated comparative Figures) මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	විගණනයේ සඳහන් පරිදි ඉදිරියේදී ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේ ආදළ ගිණුම්කරණ ප්‍රමිතවලට යටත්ව ඉදිරිපත් කිරීමට සටහන් කර ගනිමි.	ප්‍රමිතිය ප්‍රකාරව වැරදි නිවැරදි කිරීමේදී අවශ්‍ය ඉදිරිපත් කිරීම් සිදු කිරීමට ආයතනය කටයුතු කළ යුතු බව
(ඇ) <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07</u> (i) ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය වී තිබුණු පිරිවැය රු.7,132,880 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගැනීමින් පැවතුණි. ඒ අනුව ඇති වී තිබුණු ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	විගණනය මගින් දක්වා ඇති සමහර උපකරණ භාවිතා නොවන බැවින් ඉවත් කර ඇති අතර එම උපකරණ 2019 වර්ෂයේ පැවති භාණ්ඩ සමීක්ෂණයෙන් 2020 ජුනි 30 දින ඉවත් කර ඇත. තවද භාවිතයට ගත හැකි උපකරණ 2020 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනයක් සිදු කර ගිණුම්වලට සටහන් කර	ප්‍රමිතය ප්‍රකාරව ස්ථාවර වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර ක්ෂය ප්‍රමාණය තීරණය කලයුතු බව

			ගැනිමට කටයුතු කරන ලෙස ගිණුම් අංශයට උපදෙස් ලබා දි ඇත.	
(ii) භාවිතා කල කාලයට පමණක් වත්කම් ක්ෂය කලයුතු වුවත් ආයතනය විසින් වත්කම් මිලට ගන්නා වසරේදීත් විකුණන වර්ෂයේදීත් සම්පූර්ණයෙන් ක්ෂය කිරීමේ පදනම මත වත්කම් ක්ෂය කර තිබුණි. එම නිසා ප්‍රවර්ථන වර්ෂය තුලදී මිලට ගන්නා ලද, පිරිවැය රු.6,692,704 ක් වූ වත්කම් අයිතම15 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ වැඩිපුර ක්ෂය වියදම රු.374,104. ක් විය	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	විගණනය මගින් පෙන්වා දුන් ක්ෂය කිරිම් 2019 වර්ෂයේ මිළදි ගත් දින පදනම් කරගෙන ගණනය කර දක්වා තිබුණත් නමුත් ආයතනය ගිණුම් සැකසිමේදි ක්ෂය කර ඇත්තේ මිළ දි ගත් වර්ෂයේ සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය කිරිම ක්ෂය ප්‍රතිපත්තිය නිසාවෙනි. එය සටහන 02 යටතේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇත.	ප්‍රමිතයේ සඳහන් උපදෙස් ප්‍රකාරව වත්කම් භාවිතයට ගන්නා කාලය මත පදනම්ව ක්ෂය කලයුතු වන අතර ඒ අනුව ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය වෙනස් කර ගතයුතු බව.
(ඉ) ආයතනය වර්තමානයේ ජාවත්ත ප්‍රදේශයේ කම්කරු දෙපාර්තමේන්තුව සතු හෙක්ටයාර් 0.1840 ක භූමියක ඉදිකරන ලද ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 දක්වා ආයතනය රු.21,140,552 ක් වැය කර තිබුණි. 2020 අගෝස්තු 05 දින වන විටත් වත්කමේ අයිතිය ආයතනය වෙත පවරාගෙන නොතිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි ඡේද 87(9)	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය පිහිටි ගොඩනැගිල්ල ආයතනය ආරම්භය සිටම කම්කරු දෙපාර්තමේන්තුව මගින් මාසික කුලි පදනමක් නොමැතිව ලබා දි ඇති අතර ගොඩනැගිල්ලෙහි නඩත්තු කටයුතු හා එහි වත්කම් නිසි ලෙස	ප්‍රමිතයේ සඳහන් මහපෙන්වීම් අනුව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් හෙලිදවරවු කිරීම් කලයුතු බව.

ප්‍රකාරව ආයතනය පවත්නා ඉඩම හා ගොඩනැගිලිවල අයිතිය නොමැතිවීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි.			නවීකාකරණය මෙන්ම වැඩිදියුණු කිරීම අප ආයතනය විසින් මුදල් උත්පාදනය මහජනතාවට සේවයන් ද සලසනු ලබයි. ඉදිරි ගිණුම් ප්‍රකාශනයන්හි ප්‍රමිත අංක 07 අනුව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට සටහන් කර ගනිමි.	

1.4.3 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) පෙර වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.103,054 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබූ අතර එම මුදල සමාලෝචිත වර්ෂයේ පෙර වර්ෂ ගැලපුම් ලෙස ඉදිරිපත් කිරීම වෙනුවට ස්ථාවර තැන්පතු පොලී ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් වර්තමාන මෙහෙයුම් ලාභය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	අදාළ විගණන විමසුම සම්බන්ධයෙන් එකඟ වන අතර වැරදිමකින් පරිගණක පද්ධතියට තොරතුරු යාවත්කාලීන කිරීමේදී පෙර වර්ෂ ගැලපීමක් ලෙස සටහන් කළ යුතු වුවත් 2019 වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත වී ඇත.	ස්ථාවර තැන්පත් පොලිය නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය.

			ඉදිරි වර්ෂවලදි ගිණුම් සැසදීමේ දි එසේනොවීමට වග බලා ගැනීමට ගිණුම් අංශයට උපදෙස් ලබා දි ඇත.	
(ආ) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල පෙර වර්ෂ ගැලපුම් ලෙස රු.479,867 ක් දක්වා තිබුණද, පෙර වර්ෂ ගැලපුම් ගිණුමේ ශේෂය රු.590,833 ක් විය. මේ අනුව පූර්ව වර්ෂ ගැලපුම් ගිණුම හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල ඇතුලත් පූර්ව වර්ෂ ගැලපුම් අතර රු.110,966.45 ක වෙනසක් නිරීක්ෂණය විය.	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	විගණනයේ සඳහන් කළ පෙර වර්ෂ ශේෂ ගැලපිම් සම්බන්ධ ස්කන්ධ ප්‍රකාශය ඉදිරියේ නිවැරදි ලෙස ඉදිරිපත් කිරීමට සටහන් කර ගනිමි.	නිවැරදිව පූර්ව වර්ෂ ගැලපුම් ඇතුලත් කර ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සකස් කල යුතු වේ.

1.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.5.1 ලැබිය යුතු ගිණුම්

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම්	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතනයේ ණයගැති ශේෂය	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය	ආයතනයේ ගිණුකරණ මෘදුකාංග (Quick Books) මගින් ණයගැනි විශ්ලේෂණ වාර්තාව	ණයගැනි ශේෂය හා අමාත්‍යාංශයෙන් ලැබිය යුතු

රු.9,265,761 ක් වූ අතර ණයගැති කාල විශ්ලේෂණය අනුව ඉන් රු.3,348,710 ක් දින 90 ට වඩා වැඩි ණයගැති ශේෂයන් පැවතුණද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.		යුතුය.	හා ශේෂ පිරික්සුම් වාර්තාවක් යොදා ගනිමින් Excel මෘදුකාංගයේ මූල්‍ය ප්‍රකාශන සැදීමේ දී වැරදීමකින් 155,957/= ණයගැතියන් හා අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ගිණුම් අතර මාරුවීම් හේතුවෙන් මෙම වරද සිදු ව ඇත. නමුත් ගිණුම්කරණ පද්ධතියෙහි වෙනසක් නොමැති බවත් ගිණුම් ඉදිරිපත් කිරීමේ දෝෂයක් ලෙස ප්‍රකාශ කළ හැකිය. එම මුදල් ණයගැති ශේෂයෙහි මූළු මුදලේ වෙනසක් නොවී ඇති බව තවදුරටත් තහවුරු කරමි.	මුදල් නිවැරදි අගයට මූල්‍ය ප්‍රකාශන තුල දැක්වීමට කටයුතු කල යුතුය.
(ආ) 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කම්කරු අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල් ලෙස රු.7,623,444 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද කම්කරු අමාත්‍යාංශයේ එදිනට මූල්‍ය ප්‍රකාශන අනුව එම බැරකම රු.4,074,197 ක් ලෙස දක්වා තිබුණි. මේ නිසා ඉතිරි රු.3,549,247 ලැබීම් පිළිබඳ අවිනිශ්චිත තත්ත්වයක් පැවතුණි.	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	ආයතනය විසින් භාණ්ඩාගාර ලැබීම් රුපියල් 7,623,444/= ක බිල්පත් ඉදිරිපත් කර ඇතත්, ප්‍රධාන කාර්යාලය විසින් මෙම ආයතනය වෙනුවෙන් අමාත්‍යාංශයේ ගිණුම්වල ඉතිරි වූ ප්‍රතිපාදන මත බිල්පත් බැරකම් ලෙස රුපියල් 4,074,197 ක් පමණක් වාර්තා කර ඇති බව අමාත්‍යාංශයෙ ගිණුම් අංශය විසින් ප්‍රකාශ කරන ලදි. ජාතික වෘත්තීය සුරක්ෂිතතා ආයතනය භාණ්ඩාගාරය වෙත වාර්තා නොකරන බව දන්වමි.	ලැබිය යුතු මුදල් සම්බන්ධව නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. සම්බන්ධිත අනෙක් පාර්ශවය සමඟ එකඟතාවයකට පැමිණ ගිණුම්වල ලැබිය යුතු ගිණුම් ඇතුලත් කලයුතු විට සහ එසේ නොවෙනම් වෙනස්කම් පිළිබඳ හෙලිදරව් කිරීම.

1.6 නීතිරීති හා රෙගුලාසි

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2018 ජූලි 18 දිනැති කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක 03/2018 දරණ චක්‍රලේඛයේ I (ආ) සහ II වගන්ති	(i) ආයතනයේ සේවකයින්ට ගෙවනු ලබන දීමනා වැඩිකිරීම, මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය සහ නිර්දේශ සහිතව කලයුතු වුවත් එම අනුමැතීන් රහිතව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පමණක් ලබාගෙන රු.369,894 ක මුදලක් ගෙවීම් කර තිබුණි.			ආයතනය මගින් සති අන්තයේදී පවත්වන ඩිප්ලෝමා හා සහතිකපත් පාඨමාලා මගින් 2019 වර්ෂය සඳහා වාර්ෂික ආදායම ලෙස රු.මිලියන 18 ක් උපයා ඇත. මෙම ආදායම ඉපයීමේදී කාර්ය මණ්ඩලය ඇපකැප වී තමන්ගේ රාජකාරිය ඉක්මවා හොස් කටයුතු කර ඇත. අමතරව කරනු ලබන කාර්යයන් සම්බන්ධයෙන් ඔවුන් දිරිමත් කිරීමේ අරමුණින් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමුකර ඉදිරිපත් ආදායම සලකා බලා අනුමැතිය ලබාදී ඇත. කම්කරු අමාත්‍යාංශය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් එකී දීමනාව සඳහා අනුමැතිය ඉල්ලා ඇති අතර ඉදිරි දින කිහිපයේදී අමාත්‍යාංශ නිරීක්ෂණ ලබාදීමෙන් එම අනුමැතිය හිමිවනු ඇති බවට අපේක්ෂා කරමි. දැනට විගණනයෙහි නිරීක්ෂණය අනුව සියලු	දීමනා ගෙවීම් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය.

(ii) ආයතනය විසින් පවත්වන පාඨමාලා සඳහා සහභාගී වන සම්පත්දායකයින් වෙත දීමනා ගෙවීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණු සීමාවන් ඉක්මවා සමාලෝචිත වර්ෂය තුලදී රු.1,022,750 ක් වූ සම්පත්දායක දීමනා ගෙවා තිබුණි.

විගණන දින සිට දීමනා නතර කර ඇති බව දන්වා සිටිමි.

ජාතික ආරක්ෂිත සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය මගින් පවත්වනු ලබන සහතිකපත් හා ඩිප්ලෝමා පාඨමාලාවන් සඳහා දිනෙන් දිනම උපයන ආදායම හා සිසුන් ප්‍රමාණය වැඩිවීමට මූලික හේතුව වනුයේ ආරක්ෂිත සුරක්ෂිතකාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි නියැලී සිටින ආරක්ෂිකයන් එනම්, (වෛද්‍යවරු, ඉංජිනේරුවරුන්) වැනි අය මෙම පාඨමාලාවල දේශකවරුන් ලෙස යොදා ගැනීමයි. තවද අනෙකුත් ආයතනවල ගෙවන මුදලට වඩා අඩු මුදලක් මේ වන විටත් ගෙවීම් කරනු ලබන අතර පාඨමාලා මගින් උපයන ආදායම මිලියන 17 ක (2018 වර්ෂයේ) ප්‍රමාණයකි. මේ වන විටත් මේ සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එම කරුණු සලකා බලා ලිපි අංක DMS/1568 කම්කරු අමාත්‍යාංශයේ නිරීක්ෂණයක් ඉල්ලා ඇති බවට කහවුරු කරමි.

දීමනා ගෙවීම සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුවේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.28,130,642 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.21,506,251 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,624,391 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම රු.12,994,110 කින් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2015 වර්ෂයේදී, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව රුධිර සාම්පල පරීක්ෂාව සිදු කිරීම සඳහා පෞද්ගලික ආයතනයක් තෝරාගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ප්‍රධානය කර මාස	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	2014 සිටම එම ආයතනයෙන් සේවාව ලබාගෙන ඇති බවට එකඟ වෙමි. නමුත් මෙම ආයතනය අනෙකුත් ආයතන මඟින් ලබාදෙන මිලගණන් හා සැසඳීමේදී ඉතාම අවම මිලක් අයකරනු ලබයි. තවද ගිය වසර	ප්‍රසම්පාදන ක්‍රියාකාරකම්වලදී හැකිතාක් දුරට ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල

	ඉකුත් නොවූ විට පමණක් නැවත ඇනවුම් කිරීම සිදුකල යුතු වුවත් 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වසර 5 ක් අඛණ්ඩව මෙම ආයතනය මාර්ගයෙන් පමණක් රුධිර පරීක්ෂණ කටයුතු සිදුකරගෙන තිබුණි. මේ අතර කාලයේදී පරීක්ෂණ වර්ග 3 ක් සඳහා වන ගාස්තු රු.300 බැගින් වැඩි කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි.	කිහිපය සඳහා රු.300 ක පමණක් මිල වැඩිවීමක් කර ඇත තවද රුධිර පරීක්ෂාවක් ලබා ගැනීමට මෙම ආයතනයේ ප්‍රවීන නිලධාරිනියක් ආයතනය සමඟ අදාල කර්මාන්තශාලා සඳහා පැමිණෙන අතර ඒ සඳහා අතිරේක ගාස්තුවක්ද අය නොකිරීමද මෙම ආයතනයෙන් අඛණ්ඩව සේවා ලබා ගැනීමට හේතු විය.	නිශ්චිතව දක්වා ඇති උපදෙස් හා මගපෙන්වීම් වලට අනුකූලව කටයුතු කල යුතු බව.

3.2 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) රාජ්‍ය අංශය තුල මානව සම්පත් සංවර්ධනය කිරීම යන මැයෙන් වූ 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට ආයතනය කටයුතු කර නොතිබුණි	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	ආයතනයෙහි මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් විවිධ ක්ෂේත්‍ර පුහුණු අවශ්‍යතා හඳුනාගෙන පුහුණුවීම් සඳහා යොමු කර ඇත. තවද, චක්‍රලේඛයෙහි සඳහන් ආකාරයට සංවර්ධන සැලැස්මෙහි ආකාරයටම කරුණු ඇතුලත් කිරීමට සටහන් කර	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් කළමණාකරණය කිරීම සඳහා සැලැස්මක් සකස් කලයුතු බව.

(ආ) 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ 9 (II) වන වගන්තිය ප්‍රකාරව ආයතනයේ කාර්යක්ෂමතාවය පරිපාලනය සඳහා අවශ්‍ය විය යුතු පරිදි ආයතනයේ අධ්‍යක්ෂකවරු වශයෙන් යම් තැනත්තන් සංඛ්‍යාවක් පත්කල යුතු බවටත් 06 වගන්තිය ප්‍රකාරව සභාව විසින් ආයතනයේ අධ්‍යක්ෂවරයෙකු ලේකම්වරයා ලෙස පත්කල යුතු බවටත් දක්වා තිබුණ ද ආයතනයේ ඉහළම තනතුරු 7 ට අදාල අධ්‍යක්ෂ තනතුරු 6 ක් පුරප්පාඩුව පැවතුණි.	නව නිරීක්ෂණයකි	පද්ධතිය හඳුන්වාදිය යුතුය.	ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයෙහි අධ්‍යක්ෂවරුන් විගණනයෙහි සඳහන් ප්‍රමාණය අනුමත කරගත් අතර ආයතනයෙහි අවශ්‍යතාවය පදනම් කරගෙන එම තනතුරු සඳහා අනුයුක්ත කිරීමට ඉදිරියේදී කටයුතු කරමි.	ආයතනය කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය නිලධාරීන් සේවා නියුක්ත කලයුතු බව.

Hemagawa.

ටී.ජී.අයි.පද්මිණී,
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.



Ministry of Labour



ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

නො. 97, ජාවත්ත පාර, කොළඹ 05, ශ්‍රී ලංකාව

+94 112 2 585 425

+94 112 2 585 425

info@niosh.gov.lk